වෛද්‍ය ලෝකය

# පාකින්සන් හඳුනා ගත් අංශ රෝගය

දිගු කලක් පුරා කරන ලද ගවේෂණ හා පර්යේෂණවල ප්‍රතිඵල වශයෙන් 1960 වර්ෂයේ දී පාකින්සන් ආබාධයේ සැබෑ හේතුව අනාවරණය විය. මිනිස් මොළයේ ඇති සම්ස්ටැන්ෂියා නිග්‍රා (Subsrantia nigra) නම් ඇබිති කොටසේ සෛල උත්හිටි ගමන් අක්‍රියවීම එය බැව් දැන් නිසැකව ම දැනගෙන ඇත.

මිනිස් ජීවිතය කාළකන්නි කරන බියකරු එකකි. මෙය ආයුර්වේදයේ "අර්දිත රෝගය" යනුවෙනුත් සාමාන්‍ය ව්‍යවහාරයෙහි "අංශභාගය" යනුවෙනුත් හැඳින් වේ. අත් පා හිස හා මුහුණ ආදියේ මාංශ පේශි පාලනය කළ නොහැකි වීම එහි ප්‍රධාන ලක්ෂණයයි. ආබාධිතයෝ අත්සන් කිරීමේ සිට මෝටර් රථයක් පැදවීම දක්වා වූ එදිනෙදා ජීවිතයේ හැම කටයුත්තක් ම තනිව කරගත නොහැකි, ඉතා අසරණ තත්ත්වයට පත්වෙති. ඔවුන් ගේ මුහුණු කිසිම හැඟීමකින් තොර "වෙස් මුහුණු"වල ස්වභාවයට පත් වෙයි. මුඛය ඇරී "සන්නි කෝළම්" මුහුණු සේ පැත්තකට ඇද වී යයි. කට දෙකොණින් කෙළ පෙරෙයි. කථා කරන්නට අවශ්‍ය වුවද දිව ඊට අවනත නොවේ. නොපැහැදිලි රළු ශබ්දයක් පමණක් උගුරෙන් පිටවෙයි. වර්ෂයක් තුළ ලෝක ජනතාවගෙන් මිලියන ගණනක් ගොදුරු කර ගන්නා මෙම ආබාධය වැඩිපුරම වැළඳෙන්නේ වයස අවුරුදු හැට පසුකළ අයටයි. එහෙත් වයස තිස් හතළිස් ගණන් වල අය ද ඊට ගොදුරු වන අවස්ථා කොතෙකුත් තිබේ.

දීර්ඝ කාලයක් ම ගුප්ත රෝගයක්ව තිබූ මෙය මුලින් ම නිශ්චය කරන ලද ඉංග්‍රීසි වෛද්‍යවරයා ගේ නමින් අද ප්‍රකට වී තිබේ. එම වෛද්‍යවරයා ගේ නම ජේම්ස් පාකින්සන්. උපත 1755 දී ය. රෝගයේ වෛද්‍යමය නාමය Paralysis agitans වේ.

බෞද්ධ සාහිත්‍යයේ මේ රෝගයෙන් පෙළුණ පුද්ගලයකු පිළිබඳ පුවතක් ඇත. ඔහු ගෝරිමන්ද සිටුවරයා ය. ග්‍රීක රෝම හා පාරසීක ලේඛනවල මේ රෝගයෙන් පෙළුණු බවට සැක කළ හැකි පුද්ගලයන් පිළිබඳ පුවත් ඇත. මෙයින් පෙනෙන්නේ මෙම ආබාධය මිනිස් ඉතිහාසයේ ඈත සිටම පැවතුන බවයි. එදා ලෝක බොක්සිං ශූරතාවය දිනා සිටි මොහමඩ් අලි අද පාකින්සන්ගේ ආබාධයට ගොදුරුවී සිටී. මෙය කියවන ඔබ ගේ ඥතීන් හා හිතවතුන් මේ රෝගයට ගොදුරු වී සිටිනවා විය හැක.

දිගු කලක් පුරා කරන ලද ගවේෂණ හා පර්යේෂණවල ප්‍රතිඵල වශයෙන් 1960 වර්ෂයේ දී පාකින්සන් ආබාධයේ සැබෑ හේතුව අනාවරණය විය. මිනිස් මොළයේ ඇති සම්ස්ටැන්ෂියා නිග්‍රා (Subsrantia nigra) නම් ඇබිති කොටසේ සෛල උත්හිටි ගමන් අක්‍රියවීම එය බැව් දැන් නිසැකව ම දැනගෙන ඇත. ශරීරයේ අවයවයන්හි හැසිරවීම හා සමබරතාව පාලනය කරන ස්ට්‍රියාටම් නම් කේන්ද්‍රයක් මොළයේ වෙයි. එය ක්‍රියාත්මක කරවන ඩොපමින් (Dopamine) නම් රසායනය (Chemical) නිපදවන්නේ සබ්ස්ටැන්ෂියා නිග්‍රා නම් කොටසේ ඇති සෛල විසිනි.

එම සෛල අක්‍රිය වූ කළ එහි ප්‍රතිඵලය වන්නේ ස්ට්‍රියාටම් කේන්ද්‍රයේ කටයුතු ඇනහිටීමයි.

1968 වර්ෂයේ දී වෛද්‍යවරුන් විසින් නිපදවන ලද එල් – ඩෝපා (L-dopa) නම් බෙහෙත පාකින්සන් රෝගීන්ට දිව ඔසුවක් විය. එයින් සිදුවූයේ දිව ඩොපමින් බවට පරිවර්තනය වී ඩොපමින් ඌණතාවය හේතුවෙන් රෝගියා වෙත තිබෙන වෙව්ලුම (Shiveringl) අඩුකර ලීමයි. මේ ඔසුව ආබාධයේ මුල් අවස්ථාවේ සහනය සැලැස්සුවද එය ක්‍රමයෙන් උග්‍රවන විට නිෂ්ඵල තත්ත්වයට පත් විය. එම ඔසුව වැඩි වැඩියෙන් ගතිත්ම ආබාධිතයන් ගේ සිරුරවල තදබල අතුරු විපාකයක් දක්නට ලැබිණි. එනම් එහි දැඩි අනිවජානුග චලනයක් (dyskinesia) ඇතිවීමයි.

**සරත් රණවීර**

පාකින්සන් ආබාධයට පිළියම් සෙවූ විද්වත් පිරිස් අතරින් එක්සත් ජනපදයේ මෙක්සිකෝ සිටි ආරෝග්‍ය ශාලාවේත් මෙක්සිකෝහි ජාතික සරසවියේත් සේවය කළ වෛද්‍යවරුන් කණ්ඩායමක් ඉග්නාෂියෝ මැඩ්රායේ නම් මහාචාර්යවරයා ගේ මූලිකත්වයෙන් එක්තරා ගවේෂණාත්මක සැත්කමක් කළහ. පාකින්සන් රෝගයෙන් ආබාධිත වූවකු ගේ ඇඩ්‍රිනල් ග්‍රන්ථියෙන් ගත් පටක ඇබිත්තක් ඔහු ගේ මොළයේ ස්ට්‍රියාටම් කේත්‍රයට බද්ධ කිරීම ඒ සැත්කමයි. ස්වාභාවිකවම ඩොපමින් මූලාශ්‍රයක් වූ එම පටක බද්ධ කිරීමෙන් පසු නිරෝගීව වැඩි ඩොපමින් ස්වාභාවිකව නිපදවන්නට වෙයි. මෙම සැත්කමට මුලින් ම බඳුන් වූයේ මැක්සිකානු රෝගීන් දෙදෙනෙකි. යටකී සැත්කම කිරීමට පෙර තදබල ලෙස රෝගීව උන්නද සැත්කමින් පසුව ක්‍රමක්‍රමයෙන් ඔවුන් ගේ රෝග තත්ත්වය පහව ගියේ ය. අවසානයේ ඔවුහු ස්වාභාවික දිවියක් ගත කරන්නට වූහ. සැත්කමේ ප්‍රතිඵල ඉතා විශ්මය ජනක වූ අතර එය වෛද්‍ය ලෝකය ඔකඳ කරවන්නක් වූයේ ය.

යටකී සැත්කම ගැන ඇසූ තවත් ඇමරිකානු වෛද්‍යවරුන් පිරිසක් වසරකට ඇමරිකන් ජාතිකයන් මිලියනයක් පමණ ගොදුරු කර ගන්නා මෙම ආබාධයට සැත්කම් පිහිට ලබා ගන්නට ඉදිරිපත් වූහ. ටෙනසි ප්‍රාන්තයේ පිහිටි **වැන්ඩර්බිල්ට් පාකින්සන් ආබාධ සායනයේ** සේවය කළ ස්නායු ශල්‍ය වෛද්‍යවරුන් වූ නොයෙල් තුලිපැන් සහ **ජෝර්ජ් ඇලන්** ගේ මෙහෙයවීම යටතේ සංවිධානය වූ වෛද්‍යවරුන් පිරිසක් සැත්කම කරනු පිණිස ආබාධිතයන් කීප දෙනෙකු තෝරා ගත්හ. ඒ අය මුලින් ම යෝග්‍යතාව හා ඔරොත්තු දීමේ ශක්තිය මැනෙන දැඩි

මේ ආබාධය පිළිබඳ වෛද්‍ය ආකල්ප හා ක්‍රියාමාර්ග විමැසීම අවසන් කළ අප දැන් වෙනත් අංශයක් පිළිබඳව සිත් යොමු කළ යුතුයි. බෞද්ධ කර්ම විපාක නියාමය අනුව බලන කළ මේ ආබාධය තම කය අනුන්ට හිංසා පීඩා කිරීමට හා තම අවශ්‍යතා සඳහා අනුන් ගොදුරු කර ගැනීමට යෙදූ අයට වැඩිපුරම වැළඳෙන්නක් සේ පෙනේ.

පරීක්ෂණයකට ලක් කරනු ලැබූහ. අවසානයේ සැත්කම සඳහා ඇමරිකානුවන් සය දෙනකු තෝරා ගන්නා ලදී. ඔවුන් ගේ නම් ස්ත්‍රී පුරුෂ භාවය සහ වයස මෙසේ ය. ජෝන් ඩයිල්ඩ්රස් (පුරුෂ 49) ලැරී ෂෙල්බි (පුරුෂ 41) රිචඩ් හැසාඩ් (පුරුෂ 42) ඩිකී බැගට් (පුරුෂ 42) නැන්සි මූඩි (ස්ත්‍රී 39) ටෙස් පොලන්බි (ස්ත්‍රී 39) පුරුෂයන් 03 යි. ස්ත්‍රීන් 03 යි.

යටකී වෛද්‍යවරුන් පිරිස මෙම සැත්කමේදී මොවුන් බඳුන් කළ ප්‍රණීත ක්‍රියාවලිය මෙසේ ය.

1. රෝගියා ගේ හිසේ ඉදිරිපසින් සම පටක හා හිස් කබල පසා වනසේ දැහුලක් පමණ රවුම් කැපුමක් කිරීම.

2. පරිගණකයක මග පෙන්නුම ඇතිව මොළයේ ස්ට්‍රියාටම් කේන්ද්‍රයට සිහින් කුට්රයක් යැවීම.

3. රෝගියා ගේ පිටේ පහළ කොටස කපා ඇඩ්‍රිනල් ග්‍රන්ථියෙන් (මෙය වකුගඩුවල මුදුනේ පිහිටි හෝමෝන වර්ග තිහක් නිකුත් කරන්නකි.) පටක කැබලි කීපයක් වෙන් කර ගැනීම

4. මොළයේ කෝඩේට් න්‍යෂ්ටියෙහි කුඩා විවරයක් කැපීම

5. ඇඩ්‍රිනල් පටක කැබලි ඒ තුළ තැන්පත් කොට නොගැලවෙන සේ සවිකිරීම.

6. අවසානයේ හිස් කබලේ සියළු සැත්කම් කැපුම් මසා දැමීම.

යටකී සැත්කමට භාජනය වූ පසු එම රෝගීන් සය දෙනා එදිනෙද ජීවිතයේ සියළු වැඩ කටයුතු කරගෙන යාහැකි සේ ක්‍රමික සුවයක් ලැබූහ. ඒ කෙසේ ද? ඔවුන් ගේ මොළයට බද්ධ කරන ලද ඇඩ්‍රිනල් පටක එහි ස්ට්‍රියාටම් ප්‍රදේශයට අවශ්‍ය ඩොපමින් නිරතුරු සැපයූ බැවිනි. මුඛයට ආහාර ගෙන යනු වස් හැන්ද එසවීම හා අත්සන යෙදීම යන දෙකාරියත් පවා කර ගත නොහැකිව උන් ජෝන් ඩයිල්ඩ්රස් දැන් දඩයමේ යාම, මසුන් ඇල්ලීම පමණක් නොව සිය ට්‍රක් රථය පැදවීම පවා කරයි. ඉතාම අසරණ තත්ත්වයෙන් පසු වූ බැගට්, මූඩි හා පොලෙන්බි ආදී සෙසු අය ද එදිනෙද ජීවිතයේ කටයුතු මෙන් ම ක්‍රීඩා කිරීම හා ඔරු පැදීම වැනි විනෝදාංශ වල ද යෙදෙති.

මේ වන විට ඇමරිකා එක්සත් ජනපදයේ වැන්ඩර්බිල්ට් සායනය ඇතුළු ආරෝග්‍යශාලා කීපයකට පාකින්සන් රෝගීන් දහස් ගණනකට එකී සැත්කම සිදු කොට ඇත. මේ රෝගයට ගොදුරුව ඉතා අසරණ තත්ත්වයේ පසුවූ මොහමඩ් අලි දැන් ජාත්‍යන්තර කටයුතුවල නිතරව සිටී. නොබෝද ඔහුට එක්සත් ජාතීන්ගේ සංගමය සම්මානයක් පුද කළ අවස්ථාවේ ඔහු තමන් පිළිගැනීමට පැමිණ සිටි අය අතර උන් දැරියන් දෙදෙනකු සිය මුහුණ වෙත ඔසවා හිස් සිප ගති. මුලදී ඔහුට අත් ඔසවන්නට පවා නොහැකිව තිබිණි. ඔහු යටකී සැත්කමට බඳුන් වන්නට ඇතැයි නිගමනය කිරීමට බොහෝ අවකාශ ඇත.

මේ ආබාධය පිළිබඳ වෛද්‍ය ආකල්ප හා ක්‍රියාමාර්ග විමැසීම අවසන් කළ අප දැන් වෙනත් අංශයක් පිළිබඳව සිත් යොමු කළ යුතුයි. බෞද්ධ කර්ම විපාක නියාමය අනුව බලන කළ මේ ආබාධය තම කය අනුන්ට හිංසා පීඩා කිරීමට හා තම අවශ්‍යතා සඳහා අනුන් ගොදුරු කර ගැනීමට යෙදූ අයට වැඩිපුරම වැළඳෙන්නක් සේ පෙනේ. තම තරුණ කාලය ලිංගික විෂමාචාර සඳහා යෙදූ අය ඉනුත් විශේෂයි. මොහමඩ් අලි බොක්සිං කිරුළ හා මුදල් උදෙසා හිතා මතා අන්‍යයන්ට දැඩි මුෂ්ටි ප්‍රහාර එල්ල කළ අයෙකි. ඔහුට එහි විපාකය ලැබිණි. රයිගම් කෝරලයේ විසූ මහා පොහොසතෙක් තම ගැටවර, තරුණ, මැදි යන කාලත්‍රයේම ලිංගික අපචාරවල නියැලුණි. ඔහුට ධනය කීර්තිය බලය තිබුණි. එහෙත් ජීවිතයේ අවසාන වසර කීපය පාකින්සන් ආබාධයට ගොදුරුව ඉතා අසරණ දුක්ඛිත දිවියක් ගෙවා එයින් ම මිය ගියේ ය. ඔහු ගේ ධනය හා කීර්තිය ආදී කිසිවක් රෝගයෙන් ගැලවීමට උපකාර නොවී ය. මේ අනුව තරුණවියේදී කය සංවර කර ගෙන ධාර්මික ජීවිතයක් ගත කිරීම වැඩිහිටි වියේදී පාකින්සන් රෝගයෙන් මිදීමට ඇති මාර්ගය බව කිව යුතුයි. නවීන සැත්කම් හා ඖෂධ ආදියෙන් ඉන් සුවය ලබා ඇති අය ඉහත කළ පින් මහිමය මතුවී එම තත්ත්වයට පත් වූවා විය හැක. අපට වැළඳෙන බලවත් ආබාධවලට අප විසින් පෙර සහ දැන් ආත්මයේ කරන ලද පාප කර්මයන් මුල් වන බැව් ජීනා සර්මිනාරි නම් සුප්‍රකට ඇමරිකානු මනෝ වෛද්‍ය වරිය ඉතාම සහේතුකව පෙන්වා දී ඇත. ඒ ඇය විසින් ලියන ලද "Many Mansions" නම් ග්‍රන්ථයෙනි. ❑